දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No.1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/06-01-62/01/2017
ඔබේ අංකය / உமது இல. / Your No.: BC/E/01/04/31
දිනය / திகதி / Date: 2018.04.10

20 APR 2018

528
19 APR 2018
අධ්‍යක්ෂ ජනරාල්
විමර්ශන කොමිෂන් සභාව

අධ්‍යක්ෂ ජනරාල්

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

**<u>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - බණ්ඩ 02 සේවා ගණය (විමර්ශන නිලධාරී) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය.</u>**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2018.03.28 දිනැති ලිපිය හා බැඳේ.

02. මගේ සමාංක හා 2018.03.23 දිනැති ලිපිය මගින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - බණ්ඩ 02 සේවා ගණය (විමර්ශන නිලධාරී) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත සහතික කර එවන ලදී. නමුත් එහි ඇමුණුම Vහි "පරීක්ෂණයේ නම: II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම" ලෙස සංශෝධනය විය යුතු බව අනාවරණය විය. ඒ අනුව සංශෝධනය කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ ඇමුණුම Vහි මුල් පිටපත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුතුව මේ සමග එවමි. එබැවින් 2018.03.23 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කරන ලද ඇමුණුම V ඉවත් කර මේ සමග අත්සන් කර එවන ලද ඇමුණුම V ඇතුළත් කර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

03. තවද මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

DA/DF
FNA Pls.
Director General
19/4/18

පිටපත්

1. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - මුල් පිටපත මේ සමඟ එවමි.
2. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - මුල් පිටපත මේ සමඟ එවමි.

ඇමුණුම V

01. පරීක්ෂණයේ නම: II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

02. විභාගය පිළිබඳ විස්තර: ලිඛිත පරීක්ෂණයකි.

03. ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| <u>සාමාන්‍ය පරිපාලනය</u><br>i ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි<br>ii ආයතන සංග්‍රහය<br>iii ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයන් | 100 | 40 |
| <u>නීතිය</u><br>i. අල්ලස් පනත<br>ii. 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත<br>iii. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය<br>iv. දණ්ඩ නීති සංග්‍රහය<br>v. 1982 අංක 12 දරණ පොදු දේපල පනත | 100 | 40 |

04. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

05. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

අත්සන:.......................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:.......................................

තනතුර:.......................................

දිනය: 2018 - 03 - 28

නිල මුද්‍රාව:

අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

-PT. Branch

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ**

**ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණය**

**සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

01. සම්බන්ධ වන ආයතන:

| | | | |
|---|---|---|---|
| 1.1 කොමිෂන් සභාව: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | | යොමු අංකය: BC/E/01/04/31 | දිනය:2017.08.28 |
| 1.2අමාත්‍යාංශය | : | අදාළ නොවේ. | |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | | යොමු අංකය: DMS/1012 Vol I | දිනය:2017.06.06 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | | යොමු අංකය:EST-02/06/REC/15613 | දිනය:2017.11.02 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | යොමු අංකය: NSCC/10/87/SR | දිනය:2017.10.06 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | | යොමු අංකය: PSC/EST/06-01-62 /01/2017 | දිනය:2018.01.09 |

02. පත් කිරීම් බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ක්ෂෙත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි : II හා I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : තනතුරට පැවරෙන ප්‍රධාන කාර්ය භාරය වශයෙන් කිසියම් පනතක් / ආඥා පනතක් / නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන විමර්ශනය කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස අවශ්‍ය වන්නා වූ ද සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු කරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN-05 2016

5.2 මාසික වැටුප් පරිමාණය : රු. 34,605-10X660-11X755-15X930-63,460/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| II | පියවර 01 | 34,605/- |
| I | පියවර 12 | 41,960/- |

2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| 1. විමර්ශන නිලධාරී | I හා II | 200 | 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත<br>හා<br>1959 අංක 11 දරණ අල්ලස් පනත<br>හා<br>1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය,<br>යටතේ විමර්ශන පැවැත්වීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 200

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම කාර්යය සඳහා II හා I ශ්‍රේණීන් සියල්ලම ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- II

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

හෝ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම.

7.2.2.2 වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.2.2.5 වෙනත් :

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය

iii අයදුම්කරුගේ පවුලේ අයෙකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය.

iv අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සියළුම සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

v ආරක්ෂක නිෂ්කාශන වාර්තා වලට යටත්ව බඳවා ගනු ලැබේ.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අවු: 21 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව :- අවු 35 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.4.1 ලිඛිත විභාගය:

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | 100 | 40 |
| අභියෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 |
| රචනය හා සාරාංශය | 100 | 40 |

7.2.4.1.1 පවත්වන බලධරයා:- විභාග කොමසාරිස් ජනරාල් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය:- අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

ලකුණු ලබා දෙන ආකාරය :

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| **වෘත්තීය සුදුසුකම්**<br>• රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. (ඕනෑම විෂයක පාඨමාලාවකට ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10 )<br>• පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවකට (ලකුණු 3 බැගින් උපරිම ලකුණු 12)<br>• පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම විෂයයක් යටතේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 10) | 20 | අදාළ නොවේ. |
| පළපුරුද්ද<br>පිළිගත් ආයතනයක වෘත්තීය පළපුරුද්ද වසරකට ලකුණු 10 බැගින් උපරිම ලකුණු 20 | 20 | |
| බාහිර කුසලතා<br>ක්‍රීඩා හා සමාජීය ක්‍රියාකාරකම් | 20 | |

| | | |
|---|---|---|
| ස්වයං විඥාණය ඇගයීම<br>විමර්ශන විෂයය හා සම්බන්ධ සිද්ධි අධ්‍යයනයක් ආශ්‍රිතව සකස් කරන ලද කෙටි ලිඛිත පරීක්ෂණයක් පවත්වා එයින් අයදුම්කරුවන්ගේ විමර්ශන කුසලතාවය මැන බලනු ලැබේ.( මූලික බඳවා ගැනීමේ විභාගය සමත් වූ අයදුම්කරුවන් අතර) | 20 | |
| සන්නිවේදන හැකියාව හා පෞරුෂය | 10 | |
| වෙනත් භාෂා හැකියාව | 10 | |

සටහන :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

2. ප්‍රධාන ක්ෂේත්‍රයන් යටතේ වන සවිස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේම ප්‍රසිද්ධියට පත් කල යුතුය.

3. ලිඛිත පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා එහිදී ලබා ගන්නා ලකුණු සහ ලිඛිත පරීක්ෂණයේ ලකුණු යන දෙකෙහිම එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.

7.2.4.4.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

08.කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත /වෘත්තිය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |
| II වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණය |

(විෂය නිර්දේශය ඇමුණුම III හා IV ලෙස දක්වා ඇත)

8.2 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද - වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් විභාග වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1. II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:-

i පත්වීම ස්ථිර කර තිබීම.

ii සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

iii අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 05 තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය : සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි:

(අ) බඳවා ගැනීම හා ශ්‍රේණිගත උසස්වීම් සිදු කිරීම මෙම පරිපාටියේ සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් වරින් වර තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීනතාවයන් ද සියලු නිළධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතුවේ.

(ආ) සෑම පත්වීමක්ම ආරක්ෂක නිෂ්කාශන වාර්තා ලබා ගැනීමකට යටත් වන අතර එම වාර්තා වලින් ලැබෙන තොරතුරු මත අදාල අපේක්ෂකයා මෙම කොමිෂන් සභාවේ සේවයට සුදුසු හෝ නුසුදුසු බව තීරණය වනු ඇත.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළව වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන ............

පරීක්ෂා කලේ :

අත්සන ..............................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ..............................ආර්.සී.පී. ලියනගේ
මාණ්ඩලික සහකාර

තනතුර : ..............................අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාව

අංක: 36, මලලසේකර මාවත, කොළඹ 07.

දිනය : ........2018.03.05........ නිල මුද්‍රාව : ..............................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........ඒ.එම්.ආර්.එස්.ඩී. අධිකාරි
අධ්‍යක්ෂ (නීති)

තනතුර : ..අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව

36, මලලසේකර මාවත,

දිනය : ........2018-3-05........ නිල මුද්‍රාව : ..............කොළඹ 07......

---

යොමු අංකය : BC/E/1/4/31

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හි ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ශණය සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ..............................

නම..............................

ජනාධිපති නීතිඥ, සරත් ජයමාන්න
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අමාත්‍යාංශය
අංක: 36, මලලසේකර [illegible]

දිනය: ........2018.03.06........ නිල මුද්‍රාව:

---

යොමු අංකය: PSC/EST/06-01-62/01/2017

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හි ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය ....2018.01.09.................. දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ....(signature)....

නම : ....ඒ. කුලතුංග....

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නය:....2018.03.23....

නිල මුද්‍රාව : ඒ. කුලතුංග
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්(දෙපාර්තමේන්තු) බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය**

01. **පරීක්ෂණයේ නම:** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (දෙපාර්තමේන්තු) බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. **ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 2 | 100 | 40 |
| අභියෝගතා පරීක්ෂණය | පැය 2 | 100 | 40 |
| රචනය හා සාරාංශය | පැය 2 | 100 | 40 |

03. **ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා:** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. **ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:** පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

05. **විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම | ක්‍රීඩා, අන්තර් ජාතික සංවිධාන, තොරතුරු තාක්ෂණය, ඉතිහාසය, අපේක්ෂකයා වාසය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති ඔහුගේ/ඇයගේ දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. |
| අභියෝගතා පරීක්ෂණය | පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සන්දර්භයක් තුල ඉදිරිපත් කරන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුලින් අයදුම්කරුගේ අවබෝධය කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| රචනය හා සාරාංශය | දෙන ලද මාතෘකාවන් හෝ තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින්ම තෝරාගන්නා ලද තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැනබැලීමට සහ තරමක් සංකීර්ණ ලියවිල්ලක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව සහ නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීමට මෙයින් අදහස් කරයි. |

අත්සන:.......................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:.......................................

තනතුර:.......................................

දිනය: 2019 - 03 - 05

ජී.එම්.ආර්.එස්.ඒ. අධිකාරී
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

<u>ඇමුණුම II</u>

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්(දෙපාර්තමේන්තු) බඳවා ගැනීමේ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

01. පරීක්ෂණයේ නම: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (දෙපාර්තමේන්තු) බඳවා ගැනීමේ යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

02. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| වෘත්තීය සුදුසුකම්<br>• රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර/ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. (ඕනෑම විෂයක පාඨමාලාවකට ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10 )<br>• පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවකට (ලකුණු 3 බැගින් උපරිම ලකුණු 12)<br>• පිළිගත් විශ්ව විද්‍යාලයක ඕනෑම විෂයයක් යටතේ පශ්චාත් උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (ලකුණු 10) | 20 | අදාළ නොවේ. |
| පළපුරුද්ද<br>පිළිගත් ආයතනයක වෘත්තීය පළපුරුද්ද වසරකට ලකුණු 10 බැගින් උපරිම ලකුණු 20 | 20 | |
| බාහිර කුසලතා<br>ක්‍රීඩා හා සමාජීය ක්‍රියාකාරකම් | 20 | |
| ස්වයං විඥාණය ඇගයීම<br>විමර්ශන විෂයය හා සම්බන්ධ සිද්ධි අධ්‍යයනයක් ආශ්‍රිතව සකස් කරන ලද කෙටි ලිඛිත පරීක්ෂණයක් පවත්වා එයින් අයදුම්කරුවන්ගේ විමර්ශන කුසලතාවය මැන බලනු ලැබේ.( මූලික බඳවා ගැනීමේ විභාගය සමත් වූ අයදුම්කරුවන් අතර) | 20 | |
| සන්නිවේදන හැකියාව හා පෞරුෂය | 10 | |
| වෙනත් භාෂා හැකියාව | 10 | |

03. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

04. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:

පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

අත්සන:..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:..................................................

තනතුර:..................................................

දිනය:...2018...03...02...

ජී.එම්.ආර්.එස්.පී. අධිකාරී
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

01. පරීක්ෂණයේ නම: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (දෙපාර්තමේන්තු) සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 ආයතන සංග්‍රහය<br>පරිච්ඡේදය ii - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත් කිරීම<br>පරිච්ඡේදය vii - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දින වැටුප්<br>පරිච්ඡේදය xii - නිවාඩු<br>පරිච්ඡේදය xiii - දුම්රිය බලපත්‍ර<br>පරිච්ඡේදය xvi - නිවාඩු ගමන්<br>පරිච්ඡේදය xxviii - පරිපාලන කාර්ය පරිපාටිය හා විධි<br>පරිච්ඡේදය xxx - ආණ්ඩුවේ සේවකයින් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>පරිච්ඡේදය xLvii - සාමාන්‍ය හැසිරීම් සහ විනය<br>පරිච්ඡේදය xLviii - විනය ක්‍රියා පරිපාටිය | 100 | 40 |
| 02 මුදල් රෙගුලාසි<br>i වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>ii වියදම් ආපසු ගෙවීම්, කපා හැරීම් ආදිය සඳහා අධිකාර බලය<br>iii මුදල් පාලනය හා ගිණුම් ගත කල හැකිවීම<br>iv ලැබීම<br>v ගෙවීම<br>vi ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම<br>vii ගණන් තැබීම<br>viii අත්තිකාරම් ගිණුම<br>ix කච්චේරි ගිණුම<br>x අධිකරණවල ගිණුම<br>xi විදේශාධාර<br>xii මුද්‍රණය හා ප්‍රකාශනය | 100 | 40 |

| | | |
|---|---|---|
| xiii සැපයුම්,වැඩ හා සේවා<br>xiv විවිධ කරුණු<br><br>**<u>03. නීතිය</u>**<br>i 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත<br>ii අල්ලස් පනත<br>iii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>iv සාක්ෂි ආඥා පනත<br>v 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත<br>vi 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත<br>Vii රීට් ආඥා | 100 | 40 |

03. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

අත්සන:........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:........................................

තනතුර:........................................

දිනය: 2018-03-05

ජී.එම්.ආර්.එස්.පී. අධිකාරි
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

ඇමුණුම IV

01. පරීක්‍ෂණයේ නම: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (දෙපාර්තමේන්තු) සඳහා වන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර: ලිඛිත පරීක්ෂණයකි.

03. ලිඛිත පරීක්‍ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්‍ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්‍ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයන් | 100 | 40 |
| 2 මුදල් රෙගුලාසි සියළු පරිච්ඡේද ආවරණය වන පරිදි | 100 | 40 |
| 3 නීතිය<br>i. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය<br>ii. 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත<br>iii. 2002 අංක 25 දරණ සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබාගැනීමේ පනත<br>iv. වත්කම් අත්පත් කර ගැනීමට අදාළ නීති | 100 | 40 |

04. ලිඛිත පරීක්‍ෂණය පවත්වනු ලබන බලධරයා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

05. ලිඛිත පරීක්‍ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

අත්සන:.............................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම:.............................................
තනතුර:.............................................
දිනය:....2013-03-05.............
නිල මුද්‍රාව: ජී.එම්.ආර්.එල්.පී. අධිකාරී
අධ්‍යක්ෂ (...)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
36, මලලසේකර මාවත,
කොළඹ 07.

ඇමුණුම V

01. පරීක්ෂණයේ නම: I වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.

02. විභාගය පිළිබඳ විස්තර: ලිඛිත පරීක්ෂණයකි.

03. ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| <u>සාමාන්‍ය පරිපාලනය</u><br>i ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි<br>ii ආයතන සංග්‍රහය<br>iii ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයන් | 100 | 40 |
| <u>නීතිය</u><br>i. අල්ලස් පනත<br>ii. 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත<br>iii. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය<br>iv. දණ්ඩ නීති සංග්‍රහය<br>v. 1982 අංක 12 දරණ පොදු දේපල පනත | 100 | 40 |

04. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

05. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය පරිදි

අත්සන:.......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම:.......................................

තනතුර:.......................................

දිනය: 2018-03-05

නිල මුද්‍රාව: ජේ.එම්.ආර්.එස්.ඒ. අධිකාරී
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
36, මලලසේකර මාවත,
කොළඹ 07.